# “හෝ ගානා පොකුණ” මැයි 14 සෙනසුරාදා දෙවන වරටත් මෙල්බර්න් හිදී

කුසුම්සිරි ලියනආරච්චි සහ යශෝධරා සරච්චන්ද්‍ර පුමුඛ Next Frame Studio නිෂ්පාදනයෙන් ද සුනිල් ටී චිත්‍රපට සම නිෂ්පාදනයෙන් ද දායක වූ ඉන්දික ෆර්ඩිනැන්ඩු අධ්‍යක්ෂණය කළ ‘හෝ ගානා පොකුණ’ 2016 මැයි මස 14වන සෙනසුරාදා සවස 2.30ට මෙල්බර්න් ඇස්ටො සිනමා ශාලාවේදී නැවතත් තිරගත වනු ඇත.

ජර්මනියේ ලූකස් අන්තර්ජාතික ළමා චිත්‍රපට උළෙලේ දී හොඳම වෘතාන්ත චිත්‍රපටයට හිමි සම්මානය ඇතුළු අන්තර්ජාතික සිනමා සම්මාන රැසකින් ඇගැයුනු මෙම සිනමා කෘතිය මෑතකාලීන සිංහල සිනමාවේ වැඩිම ප්‍රේක්ෂක අවධානයට සහ විචාරක කතාබහට පාත්‍ර වූ නිර්මාණය බවට පත්විය.

මේ වනවිට ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, එංගලන්තය, කැනඩාව ඇතුළු රටවල් ගණනාවක වෙසෙන ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයින්ගේ ද නොමඳ ආදරයට බඳුන්ව ඇති ‘හෝ ගානා පොකුණ’ මැයි 14 වැනි දා මෙල්බර්න්හි දී තිරගත කෙරෙනුයේ දෙවන වතාවටය.

අනසූයා සුබසිංහ, ලූෂන් බුලත්සිංහල, ජයලත් මනෝරත්න, දයාදේව එදිරිසිංහ, ජයනි සේනානායක, ජගත් චමිල, හයසින්ත් විජේරත්න, අමා විජේසේකර, ගීතා කාන්ති ජයකොඩි, සැනට් දික්කුඹුර, ඩී. බී. ගංගොඩතැන්න, වසන්ත මුහන්දිරම් සමග නදීකා සෝමතිලක රංගනයෙන් දායක වන ‘හෝ ගානා පොකුණ’ ප්‍රධාන භූමිකා නිරූපණය කරනු ලබන්නේ දරුදැරියන් දහඅට දෙනෙකු විසිනි. ඔවුන් මෙම රංගනය වෙනුවෙන් චෙක් ජනරජයේ 55 වැනි ස්zලින් අන්තර්ජාතික ළමා හා යොවුන් චිත්‍රපට උළෙලේ දී හොඳම ළමා රංගනයට හිමි The City of Zlin සම්මානය හිමි කරගැනීම විශේෂත්වයකි.

චන්න දේශප්‍රිය කැමරා අධ්‍යක්ෂණයෙන් ද, තිස්ස සුරේන්ද්‍ර සංස්කරණයෙන් ද, සසික රුවන් මාරසිංහ ශ්‍රව්‍ය සැලසුම්කරණයෙන් ද, දිනේෂ් සුබසිංහ සංගීත නිර්මාණයෙන් ද, දමින්ද මඩවල සහාය අධ්‍යක්ෂණයෙන් ද, මංජුල අයගම කලා අධ්‍යක්ෂණයෙන් ද, ප්‍රියන්ත දිසානායක අංග රචනයෙන් ද, කුසුම්සිරි ලියනආරච්චි සහ ඉන්දික ෆර්ඩිනැන්ඩු ගේය පද රචනයෙන් ද, පාලිත තෙන්නකෝන් නිෂ්පාදන කළමානාකරණයේන ද, ආනන්ද ලියනආරච්චි සමග ස්වර්ණා මල්ලවාරච්චි විධායක නිෂ්පාදනයෙන් ද, දායක වන ‘හෝ ගානා පොකුණ’ ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා ඒකාබද්ධ නිෂ්පාදන ආයතනයක් වන Next Frame Studio හි ප්‍රථම නිෂ්පාදන කාර්යයි.

Next Frame Studio වෙනුවෙන් කුසුම්සිරි ලියනආරච්චි, යශෝධරා සරච්චන්ද්‍ර, දයානන්ද ලියනආරච්චිගේ, ශ්‍යාමා අතුකෝරළ, බිමල් ප්‍රනාන්දු, නිරෝෂා ප්‍රනාන්දු, ගීතා මුතුමාල ද සම නිෂ්පාදනයෙන් සුනිල් ටී ප්‍රනාන්දු ද අර්ථපතීත්වය සපයා ඇති මෙම සිනමා කෘතියේ තිර රචනය සහ අධ්‍යක්ෂණය ඉන්දික ෆර්ඩිනැන්ඩු විසිනි.

විමසීම් - කුසුමිසිරි 0430 112 088

**Astrological Services**
By Ramya Attygalla
(over 20 years’ experience)

Casting of Horoscope (Dala Kendera and/or Bawa Kendera)
Reading of Horoscope (Palapala)
Nekath for all occassions
Matching for compatibility (Porondam)
We do not use any software;
all work is carried out by traditional methods.

**Readings will be sent via email,
but please call if you require further details.**

Email: ramyaattygalla@gmail.com
Mobile Phone Numbers: 00 11 94 7117 90367
or 00 11 94 1127 00481

Local Inquiries: Chandini on 0422 31 2110 or 03 9798 6140

**Very reasonable charges.
Payments to a CBA Bank Account or via PayPal.**

**සන්නස මංගල යෝජනා**

**මුල් වචන 40 සඳහා මාසයකට අයකිරීම ඩොලර් 30
පහත දැක්වෙන ගිණුමට මුදල් බැර කර එම ලදු පත සමග ඔබේ දැන්වීම
අපට එවන්න** sannasanews@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

